27 පිටෙන්

දිවූ අතට දිව යන්නට විය.

කළයුත්තේ කුමක්දැයි නොදත් මම ඔවුන් හා වරිච්චි ගෙවල් සමූහයද පසුකරමින් හාත්පස එලි කරන ලද බිම් කඩකට පැමිනියෙමි. විශාල තුරු සෙවණක් යට මිනිසුන් දහදොලොස් පොලක් කකුලක් පිට කකුලක් පිට දමා ගෙන බිම වාඩිගෙන සිටියහ. මිස්ලන්ගා ඔවුන් මැදි කරගෙන ගහකට පිටදී ඔහු අත තිබූ කොමඩු ගෙඩියක් වැනි යමකින් යුෂ උරමින් සාකච්-ජාවක නිරතවෙමින් සිටින බව පෙනෙන්නට තිබුනි. මා දුටු විට අඩු තරමින් ඔහුගේ එක් මස් පිඩුවක් වත් සෙලවුනේ නැත. මා දැක සතුටට පත්වූ බවක් ද ඔහුගෙන් පළ නොවීය. සමහර විට මා තුල වූ ලැජ්ජාව නිසා ඔහු පසුබෑවා වන්නටද පුලුවන. මේ නිසා මේ අවස්ථාවට උචිත ආචාරශීලි බව යොදාගැනීමට නුපුලුවන් වුනා විය හැකිය. ? . චූටි කුමාරිහාමි ගෙදර ඉ ඳල හුගක් ඈතට ඇවිල්ල වගේ..... .මිස්ලන්ගා ප්‍රධානියා අවසානයේදි කීවේය.

ඔව් ..... මම කීවෙමි.

ඉන්පසු ඇතිවරෑයි ඉතා දිගු නිහැ'ඩියාවකි. මා එතැනට අදාල නොවන ආගන්තුක එකියක බව පසක් වීමට එතරම් කාලයක් ගත නොවීය. පිරිමින් තුල වූ හිස් නොසැලකිලිමත් බැල්මත් ගැහැණුන්ගේ විමසුම් සහගත ඇස්වලින් කෙරුණු සංවාදයත් මට එහි තවදුරටත් රැ ඳී සිටීමේ ආසාව නසා දැම්මේය.

මට එතරම් ගරු සරු බවක් නොදැක්වූ ගමෙන් පිටවී හෙමිහිට නිවසට ගෑටුයෙමි. මගේ හදවත හිස්වූ එකක් විය.

මිස්ලන්ගා මම නැවත දුටුවේ තව එක් වරක් පමණි.

එක් රාත්‍රියක තාත්තාගේ ගොවිපලේ එක් හරියක වගාවක් එලු රංචුවක් විසින් විනාශ කර තිබුනි. එය මිසලන්ගාගේ ගමේ එලුවන්ගේ වැඩක් බව පසුව හෙලිවිය.

තාත්තා එසේ පැමිණි සියලු එලුවන් තම සන්තකයට පවරා ගෙන ඔවුන් නැවත ලබා ගන්නට නම් වගා පා'ලුවට සරිලන වන්දි ගෙවන ලෙස දන්වා මිස්ලන්ගා වරයා ට පනිවිඩයක් යවන ලදි.

හිරු බැස ගිය එක් සන්ධ්‍යාවක ඔහු අපේ නිවසට පැමිනියේය. අර බිලැන්කැට්ටුව දෙවුරයේ දවටා ගෙන සිටි ඔහු පෙරටත් වඩා මහලුව සිටින බව මට පෙනුනි. තරුණයන් දෙදෙනෙකුට වාරුවී සිටි ඔහු සැරමිටියක් ඇන ඇන ඇවිද

*හිරු අවරගිරින් ගිලී යාමට ආසන්නය. එහි විවිධ වර්ණාවලීන් ගිලිහි ගොසිනි. කුරුල්ලෝ සිය අවසාන ගීත ගායනා කරති. ගවයෝ සාමකාමීව හඩ තලමින් ගාල් කරා ඇදෙති. මෙය අප්‍රිකාවේ ලස්සනම හෝරාවයි.*

ගෙන ආවේ මහත් වෑයමිනි.. අත් හෝ පා නැමීම බෙහෙවින් දුෂ්කර විය. තාත්තා ඔහු සතු විශාල සනීප පුටුවේ වාඩි ගත් අතර මහල්ලා බොහෝ පරිස්සමින් තරුණයන්ගේ උදව්වෙන් ඔහු ඉදිරියේ වාඩි ගත්තේය.

දෙදෙනා අතර සංවාදය හෝ වාදය බෙහෙවින් දිගු හා වෙහෙසකර එකක් විය. එක් හේතුවක් වූයේ ඔහු කැටුව ආ තරුණයින් දෙදෙනාගේ දුර්වල ඉංග්‍රීසි දැනුම භාෂා පරිවර්ථනයේ දි බාධාවක් වීමය. අනෙක තාත්තාට ඔවුන්ගේ භාෂාව කථා කිරීමට නොහැකි කමය.

තාත්තාගේ මතය වූයේ සිය වගාවට අඩුම ගානේ පවුම් දෙසියක වත් අලාභයක් සිදුවී ඇති බවය. මහල්ලාගෙන් ඒ මුදල අය කර ගත හැකි බව ඔහු දැන සිටියේය. ඊට අමතරව එලුවන් තමා සන්තකට ගැනීමට අයිතියක් ඇති බවද ඔහුගේ මතය විය. එහෙත් මිසලන්ගා වරයා ඉමහත් කෝපයෙන් ඊට එරෙහි විය. මගේ මිනිස්සු කොහොමද එලුවො විස්සක් නැති කරගන්නෙ? අපි පොහොසත් මිනිස්සු නෙවෙයි ඔහේ වගේ........

තාත්තා කිසිවිටික තමන් පොහොසතකු ලෙස නොසැලකුවේය. ඒ වෙනුවට තමන් දුප්පත් යැයි හැම විටම කියා සිටින්නෙකි. ඉතින් ඔහු කෝපයෙන් හා ඉතා ඉක්මණින් උත්තර දෙයි. එලුවන් සිය ගොවිපලට කරන හානිය කිසිවිටක සුලු කොට නොතකන බව ඔහු කියා සිටියේය. මේ එලුවන් සතු කර ගැනීමට සම්පූර්ණ අයිතිය තමන් සතු බව ඔහු නැවතත් තරයේ කියා සිටියේය.

වාදය කෙතරම් උනුසුම් වූයේද යත් - අන්තිමට කුස්සියේ වැඩ කළ ඔහුගේ පුත්‍රයාද පරිවර්ථකයා වශයෙන් එහි කැ ඳවන ලදී. ඉන්පසුව තාත්තා වඩාත් ව්‍යක්තව හා ඉක්මණින් ඉංග්‍රීසියෙන් කථා කරන්නට පටන් ගත් අතර කෝකියා ඒවා ඉක්මණින්ම සිය පියා වන මහල්ලාට ඔහුගේ බසට පෙරලා දෙන්නට විය. ඒ මගින් මේ සිද්ධිය නිසා තමන් කෙතරම් කෝපයෙන් සිටින්නේද යන වග මහල්ලා තේරුම් ගනු ඇතැයි තාත්තා සිතුවේය. එහෙත් මගේ තාත්තා දැරූ අදහස් වලින් භාවාතිශය නොවූ තරුණයා ඒ අදහස් පෙරලුවේ යාන්ත්‍රිකමය ස්වරයකිනි. ඇස් බිමට යොමා ගෙන සිය කාර්යය ඉටු කළද තම පිලට එරෙහිව යන ක්‍රියාවලියේ බර තම උරහිස මතත් පැටවීම පිළිබ ඳ මනා අවබෝධයක් ඔහු තුල වූ බව පෙනුනි.

හිරු අවරගිරින් ගිලී යාමට ආසන්නය. එහි විවිධ වර්ණාවලීන් ගිලිහි ගොසිනි. කුරුල්ලෝ සිය අවසාන ගීත ගායනා කරති. ගවයෝ සාමකාමීව හඩ තලමින් ගාල් කරා ඇදෙති. මෙය අප්‍රිකාවේ ලස්සනම හෝරාවයි. එහෙත් අප නිවසේ ගතවන්-න් වඩාත් අමිහිරි අවලස්සන සිද්ධියකි. මෙයින් කිසිදු පාර්ශවයකට සෙතක් අයත් නොවේ. තාත්තා අවසානයේදි කීවේ මම තවත් වාද කරන්න යන්නෙ නෑ. එලුවො ටික මම ආපහු දෙන්නෙ නෑ.... .

එවිට මහල්ලා එයට එක්වරම සිය බසින් උත්තර දුන්නේය. මේකෙ තේරුම මගේ මිනිස්සුන්ට පායන කාලෙ බඩගින්නෙ ඉන්න වෙන එකනෙ?... .

පලයන් ඉතින් පොලිසියට ..... තාත්තා ජයග්‍රාහි සිනාවක් පාමින් පිළිතුරු දුන්නේය.. තවත් කීමට කිසිවක් ඉතිරිව තිබුනේ නැත.

මහල්ලා නිසසල ව ඉ ඳගෙන සිටියේය. හිස බිමට නැවී තිබුනි. දෑත් අසරණ ලෙස දෙපසට එල්ලී තිබුනේය. ගෙවී ගිය දණහිස් ඔහුගේ සිරුර නැගිටුවා ගත නුහුණු හෙයින් තරුණයෝ දෙදෙනා ඒ ස ඳහා වාරු වූහ. සිටගත් ඔහු තාත්තාට මුහුණ දුන්නේය. සිය බසින් ඔහු වේගයෙන් කථා කළේය. ඉන්පසු ඉවත හැරී සිය ගම බලා පිරිස කැටුව පා නගන්නට විය.

මොකක්ද මිනිහ අන්තිමට ඒ කිව්වෙ? තාත්තා කේන්තියෙන් ඇසුවේ කෝකියාගෙනි. ඔහු පිළිතුරු වශයෙන් අපහසුවෙන් සිනාසුනා මිස කිසිත් කීවේ නැත.

මොකක්ද උඹේ තාත්ත කිව්වෙ?.... අපේ තාත්තා ගේ හ'ඩ තවත් වේගවත් විය.

කෝකියා සිය හිස කෙලින් කර ගෙන නිසල විය. මගේ තාත්ත කිව්වෙ තමන්ගෙ ඉඩම කියල ඔහේ කියන මේ ඉඩම ..මේ මුලු ඉඩමම අයිති එයාගෙ මිනිස්සුන්ට ලු. මේව ඒ අයගෙන් බලෙන් උදුර ගත්ත ඒවලු.

එසේ කී ඔහු කුස්සියෙන් පිටවී පියා ගිය දෙසටම යන්නට ගියේය. අපි ඔහු නැවත දුටුවේ නැත.

ඊළඟ වාරයේ අර පොලිස් නිළධාරියා පැමිණ මෙසේ කීවේය. . අර මිස්ලන්ගෙ ගම මේ හරියෙන් අයින් කරන්න තීරණය කරල තිබුනෙ හුඟ කල් ඉ ඳල. මට තේරෙන්නෙ නෑ ඒක මෙච්චර කලක් ක්‍රියාත්මක වුනේ නැත්තෙ කියල. මම ලබන ඉරිද ස්වදේශ කටයුතු භාර කොමසාරිස් හම්බ වුනා මේ ගැන සොයල බලන්නං...

■

